# දළ්හං බන්ධනං .... සිථිලං?

කේ. ධම්මජෝති හිමි

ධම්මපදය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ලා අගනා ශාස්ත්‍රීය ප්‍රදානයන්හි දායකත්වය දැරූවන් අතර කේ. මිසුනො (K. Mizuno), ජේ. බ්‍රෆ් (J. Brough) සහ එච්. ලූඩර්ස් (H. Luders) යන වියතුන්ට ප්‍රමුඛත්වයක් හිමි වෙයි. විවිධ ශ්‍රාවක සම්ප්‍රදායන් අතර පවත්නා සංකීර්ණ අන්තර්සම්බන්ධතා විෂයෙහි ඔවුන් විහිදුවා ඇත්තේ දැඩි ආලෝකයකි. කෙසේ වුවද ඉහත සඳහන් කළ අය අතුරින් ජේ. බ්‍රෆ් සහ එච්. ලූඩර්ස් ඔවුන්ගේ අධ්‍යයනයන්හි දී අදාළ චීන මූලාශ්‍රයන් උපයෝගී කර ගෙන ඇත්තේ බෙහෙවින් අල්ප වශයෙනි. මූලාශ්‍රමය ඇතැම් ගැටලු තැන් නිරාකරණය කරගනු සඳහා - අඩුම තරමින් එම ගැටලු මනාව වටහා ගැනීම සඳහා චීන උදාන වර්ගයේ (Udv. c1) අර්ථකථාගත කරුණු මෙන් ම වෙනත් සමාන්තර චීන මූලාශ්‍රයන්ට අයත් තොරතුරු ද ඇතුළත් කර ගැනීමේ වැදගත් කම මතුකර දක්වනු සඳහා නිදර්ශනයක් උපුටා දැක්වීමට මෙම ලිපිය උපයෝගී කර ගනිමු. බ්‍රෆ් සහ වෙනත් අය විසින් නොවිමසන ලද අදාළ පාලි අට්ඨකථාවන්ට අයත් ප්‍රකාශද මෙම සාකච්ඡාවේදී ප්‍රයෝජනයට ගනිමු. මෙහි ලා අප තෝරාගත් උදාහරණය ධර්මය සම්බන්ධයෙන් දැඩි වැදගත් කමක් නොදරන්නේ වුව ද එය අපගේ අරමුණ සඳහා ප්‍රමාණවත් නිදර්ශනයක් වෙතැයි සිතමු.

ධම්මපදයේ වැනි මූලාශ්‍රය පරම්පරාවන්හි පරිනාමීය ප්‍රවාහයෙහිදී මූලග්‍රන්ථවලට තුලනාත්මකව අර්ථකථාවන්ට අන්තර්ගත වී ඇති කරුණු නිබඳවම අවශ්‍යයෙන්ම පශ්චාත් කාලීනයයි නොසැලකිය යුතු බව ප්‍රාථමික නිරීක්ෂණයක් වශයෙන් මෙහිලා අවධාරණය කිරීමට කැමැත්තෙමු. ආදිම අවස්ථාවන්හි සිට මූලග්‍රන්ථ සමඟ - මෙහිලා ගාථා සමඟ එක්ව යන අර්ථකථා විවරණ නිබඳව පැවැති බව පෙනේ. මෙම මූලග්‍රන්ථය විෂයෙහි "ගාථාවන්ගේ නිදාන කථා සහ පද සඳහා අර්ථවිවරණ පවතීය"යි චීන ධර්මපදයේ (Dh(c)) පැහැදිලිවම සඳහන් කරයි. වර්ධනයෙහි ලා තව